සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/07/SD/06/ID/කාන්තා දිනය,

ඔබේ අංකය / உமது இல / Your No: ..............................

දිනය / திகதி / Date: 2016.03.01

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

## ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන 2016" දිරිය ලියට සෙවණක් "

සෑම වසරකම මාර්තු 08 වන දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව විවිධ වූ වැඩසටහන් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවනු ලබන අතර, මෙවර සුවිශේෂීමුහුණුවරකින් එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කොට තිබේ.

අඩු ආදායම්ලාභී ජනතාවගේ නිවාස ගැටලුවට යම් ශක්තියක් ලබා දීම උදෙසා සමාජ සංවර්ධන අංශයේ " දිරිය පියස " නිවාස වැඩසටහන ක්‍රියාත්මක වන අතර, මෙවර කාන්තා දිනයට සමගාමීව එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකට නිවාස 02 බැගින් පහත අරමුණු හා නිර්ණායක යටතේ දිවයින පුරා නිවාස 664 ක් ඉදිකර දීමට නියමිතය.

**අරමුණ :-**

දරිද්‍රතාවය නිසාම, හිසට සෙවණක් ඉදිකර ගැනීමට වරම් අහිමිව, දරුවන් සමඟ අනාරක්ෂිතව ජීවත් වන අසරණ පවුල් මෙහිදී විශේෂ වන අතර, ඔවුන්ට ආරක්ෂාවහා රැකවරණය ලබා දීම අරමුණු කෙරේ. සමාජයේ අවධානයෙන් ගිලිහෙමින් සිටින අසරණ පවුල්වලට සෙවණ ලබා දෙමින්, ඔවුන්ගේ දරුවන් පිළිබඳව අවධානය යොමු කරමින්, පියවරින් පියවර ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කර ඔවුන්ගේ අනාගතය යහපත් මට්ටමට ගෙන ඒමද අරමුණු අතර වේ.

**තෝරා ගැනීමේ නිර්ණායක :-**

- තම ස්වාමි පුරුෂයා මිය යාම හේතුවෙන් (වැන්දඹු) හෝ ස්වාමි පුරුෂයා හැර යාම හේතුවෙන් නිවසක් අහිමිව, දරුවන් සමඟ අනාරක්ෂිතව ජීවත් වන කාන්තා මූලික අසරණ පවුල්.
- ආබාධිත පුද්ගලයන් සහිතව දුෂ්කරතාවලට මුහුණ දෙමින් නිවසක් අහිමිව සිටින කාන්තා මූලික අසරණ පවුල්.

- ස්වාමි පුරුෂයා බන්ධනාගාර ගතවීම හේතුවෙන්, දරුවන් සමඟ නිවසක් අහිමිව අනාරක්ෂිතව දිවි ගෙවන කාන්තා මූලික අසරණ පවුල්.
- ගැහැණු දරුවන් වැඩිපුර සිටින, අනාරක්ෂිතව නිවසක් අහිමිව ජීවත් වන පවුල්.

මෙහිදි ඉඩමක් හිමි, එහෙත් කුඩා පැල්පත් වාසීව අනාරක්ෂිතව දිවි ගෙවන අසරණ පවුල් තෝරා ගැනීම සිදු කළ යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රියාවලිය**

ඉහත නිර්ණායක යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් සුදුසුම පවුල් 02 ක් බැගින් තෝරා ගත යුතු අතර කළමණාකාර අධ්‍යක්ෂ, මූලස්ථාන කළමණාකරු, කලාප කළමණාකරු, සමාජ සංවර්ධන සහකාර, වසම භාර දිවිනැගුම සංවර්ධන නිළධාරි හා ග්‍රාම නිළධාරි යන අයගෙන් යුත් කමිටුවක් මඟින් සිදු කළ යුතුය.

අනතුරුව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය අනුව දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂගේ අනුමැතිය යටතේ නිවාස ඉදි කිරීම් ක්‍රියාත්මක කළ යුතුය.

**වැඩසටහන ක්‍රියාත්මක කිරිම**

- මෙහිදී " දිරිය පියස " නිවාස වැඩසටහන මෙතෙක් ක්‍රියාත්මක කළ ආකාරයට කටයුතු කිරීම සුදුසුය.
- තෝරා ගැනීම් සිදු කිරිමේදී අදාල පවුල්වල සවිස්තරාත්මක තොරතුරු හා දැනට සිටින නිවසෙහි ඡායාරූපයක් ද අමුණා තොරතුරු රැස් කර ගැනීම කළ යුතුය.(තොරතුරු රැස්කිරීම සඳහා මේ සමඟ එවා ඇති අයදුම්පත්‍රය යොදා ගත යුතුය) නිවස ඉදිකළ පසු නව නිවසෙහි ඡායාරූපයක්ද සහිතව අදාල විස්තර අප වෙත එවිය යුතුය.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගන්නා ලද නිවාස හිමි නාම ලේඛනය, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත, දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත කඩිනමින් ඉදිරිපත් කළ පසු දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් ප්‍රධාන කාර්යාලය වෙත අදාළ නාම ලේඛණය යොමු කිරිමෙන් අනතුරුව මුදල් ප්‍රතිපාදන දිස්ත්‍රික්ක වෙත මුදා හරිනු ලැබේ.
- ඔක්තෝබර් මස 31 වන දින වන විට නිවාස ඉදිකර අවසන් කළ යුතුය.
- නිවාස සඳහා මුදල් නිදහස් කිරීමේදි දිවිනැගුම දෙපාර්තමේන්තුවට අයත් කාර්මික නිලධාරීගේ හෝ වෙනත් තාක්ෂණ නිළධාරියකුගේ නිර්දේශ ලබා ගත යුතුය.

**වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම**

| | | |
|---|---|---|
| ❖ දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | - | දිස්ත්‍රික්කයේ සමස්ථ වැඩසටහන පිළිබඳ අධීක්ෂණය |
| ❖ ප්‍රාදේශිය ලේකම් | - | අධීක්ෂණය |
| ❖ මූලස්ථාන කළමණාකරු/ කළමණාකාර අධ්‍යක්ෂ/ දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරු | - | පුද්ගලයින් තේරීම හා වරින් වර නිවාස ඉදිවීම සම්බන්ධ පසුවිපරම, අධීක්ෂණය, අදාල අංශ සමඟ සම්බන්ධීකරණය |
| ❖ සමාජසංවර්ධන සහකාර | - | නිරන්තර පසුවිපරම හා ගැටළු මතු වුවහොත් කළමණාකරු හා ප්‍රාදේශීය ලේකම් සමඟ සම්බන්ධීකරණය |
| ❖ වසම භාර දිවිනැගුම සංවර්ධන නිලධාරී | - | පරිත්‍යාගශීලින්ගේ සහයෝගය හා ප්‍රදේශවාසීන්ගේ ශ්‍රම දායකත්වය ලබා ගනිමින්, මනා නිවසක් ඉදි කිරීමට උපරිම සහයෝගය ලබා දීම |

**මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වාරික නිදහස් කිරිමේ ක්‍රමවේදය**

**නිවසක් සඳහා ලබාදෙන මුළු මුදල රු. 150,000/- කි**

| | | |
|---|---|---|
| **පළමු වාරිකය** | **-** | **රු. 60,000.00 (අත්තිවාරම හා බිත්ති මට්ටම)** |
| **දෙවන වාරිකය** | **-** | **රු. 50,000.00 (වහළ සෙවිලි කිරීම)** |
| **තුන්වන වාරිකය** | **-** | **රු. 40,000.00 (වැඩ අවසන් කිරීම)** |

මෙහිදී නිවසෙහි මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමු වාරිකය නිදහස් කිරීමෙන් අනතුරුව නිවසෙහි ඉදිකිරීම් ප්‍රගතිය පරික්ෂා කිරීමෙන් පසු දෙවන හා තුන්වන වාරික නිදහස් කළ යුතු වේ.

**ප්‍රගතිය වාර්තා කිරිම**

මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර අංක 01 අනුව ප්‍රගතිය සෑම මසකම 10 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කළ යුතුය. dddsocialho@gmail.comවිද්‍යුත් තැපැල මගින් හෝ ලිඛිතව අප වෙත

යොමු කිරිම සුදුසුය. ඔබ අප වෙත යොමු කරනු ලබන ප්‍රගතිය පදනම් කොට ගනිමින් ප්‍රධාන කාර්යාලයේ නිළධාරින් ක්ෂේත්‍රයේ පසුවිපරම් කිරිමට නියමිතය.

2016 වසරේ කාන්තා දිනය නිමිති කොට ගෙන ක්‍රියාත්මක කරනු ලබන මෙම විශේෂ නිවාස වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ සියලු දෙනාගේ දායකත්වය උපරිමයෙන් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි. ප්‍රමුඛතම කාර්යයක් සේ සලකා මේ සඳහා ඔබගේ සක්‍රීය දායකත්වය ලබා දී වැඩසටහන සාර්ථක කර ගැනීමට දායක වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.



චන්ද්‍රා වික්‍රමසිංහ,

අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:-**

1. ලේකම්, සමාජ සවිබල ගැන්විම හා සුභසාධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
2. ප්‍රධාන ගණකාධිකාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස හා අ.ක.ස
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කරු.දැ.ගැ.ස
4. සියලුම අංශ ප්‍රධානින් - කරු.දැ.ගැ.ස

**" දිරිය ලියට සෙවණක් "**

**2016 ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන යටතේ නිවාස අහිමි කාන්තාවන් සඳහා නිවාස ලබාදීමේ මූලික තොරතුරු සමීක්ෂණ පත්‍රය**

1. අයදුම්කරුගේනම -
2. ලිපිනය -
3. දිස්ත්‍රික්කය :-
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-
5. ග්‍රාම නිලධාරි වසම :-
6. ප්‍රජා මූල බැංකු සංගමයේ නම :-
7. ග්‍රාම නිලධාරි වසම භාර දිවිනැගුම සංවර්ධන නිලධාරියාගේ නම :-

8. පවුල පිළිබඳ මූලික තොරතුරු

| අනු අංකය | සම්පූර්ණ නම | ගෘහ මූලිකයාට ඇති නෑදෑකම | ස්ත්‍රී/පුරුෂ භාවය | වයස අවුරුදු | විවාහක / අවිවාහක බව | අධ්‍යාපන මට්ටම | රැකියාව |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

8.1 සමෘද්ධි සහනාධාර ලාභියෙක්ද ?

| ඔව් | නැත |
|---|---|
| | |

8.2 සමෘද්ධි සහනාධාර ලාභියෙක් නම් සහනාධාරයේ වටිනාකම රු. :-
.......................................................................

8.3 වෙනත් මහජන ආධාර ලැබෙන්නේ නම් එම ආධාරය කුමක් ද යන්න හා එහි වටිනාකම :-
රු…...............................................................................................................................................................

9.0 පවුලේ සමාජික තොරතුරු

9.1 ගෘහ මූලිකයා

1. ජීවත්ව සිටි ☐
2. මියගොස් ☐
3. ආබාධිත ☐
4. වෙනත් ☐

9.2 ළමයින් පාසල් යන්නේ නම් එම සංඛ්‍යාව ඔව් ☐ නැත ☐

9.3 ආබාධිත දරුවන් සිටී නම් එම සංඛ්‍යාව ඔව් ☐ නැත ☐

9.4 නිදන්ගත, රෝග සහිත, පවුලේ සමාජිකයන් සිටි නම් ඔව් ☐ නැත ☐

9.5 පවුලේ කිසිවෙක් මත් ද්‍රව්‍ය / දුම්වැටි භාවිතා කරන්නේද ? ඔව් ☐ නැත ☐

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

......................................... ......................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**නිර්දේශය හා අනුමැතිය**

01. ග්‍රාම නිලධාරි වසම භාර දිවිනැගුම සංවර්ධන නිලධාරි

නම :- ...................................................................

අත්සන :- .............................................................

දිනය :- .................................................................

02. දිවිනැගුම බැංකු කළමණාකරු

නම :- ..................................................................

අත්සන :- ............................................................

දිනය :- ............................................................

03. කලමණාකර අධ්‍යක්ෂ / මුලස්ථාන කළමණාකරු / ප්‍රාදේශීය ලේකම්

නම :- ............................................................

අත්සන :- ........................................................

දිනය :- ............................................................

04. දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ

නම :- ............................................................

අත්සන :- .......................................................

දිනය :- ............................................................